# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

# HVAC Mechanic (Female/Male)

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් එහි පහසුකම් කළමනාකරණ කාර්යාලයේ තාපක, වෙන්ටිලේටර සහ වායු සමීකරණ (HVAC) කාර්මික ශිල්පී තනතුරෙහි සේවය කිරීම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර දරන්නා විසින් නේවාසික හෝ කල්බදු ක්‍රමය යටතේ පවතින දේපළ ඇතුලු තානාපති කාර්යාලයට අයත් සියලුම ගොඩනැගිලි සහ පරිශ්‍රවල තාපක, වෙන්ටිලේටර සහ වායු සමීකරණ (HVAC) පද්ධති නඩත්තු සහ අලුත්වැඩියා කිරීම් සිදුකළ යුතු වේ.

**පූර්ණ කාලීන ව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇමෙරිකානු ඩොලර් 479.91 කි.**

[කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මඟින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2024 ඔක්තෝබර් 21 වනදා වන විට විනිමය අනුපාතය ඇ.ඩො.1 = රු. 293 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.]

**සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:**

1. **අධ්‍යාපනය** - ද්විතියීක අධ්‍යාපනය සම්පූර්ණකර තිබිය යුතුය (අ.පො.ස. සාමාන්‍ය පෙළ සම්පූර්ණකර තිබීම - ගණිතය ඇතුලු විෂයයන් 6ක් සමත්ව තිබිය යුතු අතර ඉන් අවම වශයෙන් විෂයයන් 3ක් සඳහා විශිෂ්ට හෝ සම්මාන සාමාර්ථ තිබීම). තවද පිළිගත් අධ්‍යාපන ආයතනයකින් HVAC කාර්මික ශිල්පීන් සඳහා විශේෂ වූ පුහුණු ශිල්පී මට්ටමේ වෘත්තීය පුහුණු පාඨමාලාවක් නිමකර තිබිය යුතුය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

2. **පූර්ව රැකියා පළපුරුද්ද** - වාණිජ හෝ කර්මාන්ත මට්ටමේ තාපක, වෙන්ටිලේටර සහ වායු සමීකරණ නඩත්තුව සහ අලුත්වැඩියාව පිළිබඳ අවම වශයෙන් වසර 3ක සේවා පළපුරුද්ද තිබිය යුතුය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

3. **භාෂා ප්‍රවීණතාවය** -
II මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.**(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
III මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4. **රැකියා දැනුම** -
   - ස්ටාටර් මෝටර, උෂ්ණත්ව පාලක, ආර්ද්‍රතා පාලක, විචල්‍ය සංඛ්‍යාත ධාවක (VFD), මෝටර සහ පාලක, මෝටර් සහ ගුරුත්ව ඩැම්පර් (motorized and gravity damper), සංවේදක සහ ගොඩනැගිලි ස්වයංක්‍රීයකරණ පද්ධති, ඌෂ්මක, හයිඩ්‍රොනික් පද්ධති, උණු වතුර හීටර සහ තාප පොම්ප, වාෂ්පීකාරක සහ කන්ඩෙන්සර, ශීතකරණ සහ බොයිලර් ඇතුලු තාපක, වෙන්ටිලේටර සහ වායු සමීකරණ (HVAC) පාලක නඩත්තුව සහ අලුත්වැඩියා කිරීමේ හැකියාව තිබිය යුතුය.
   - මොටර් වැල්ව්, පොම්ප, පාලක සහ සටහන් කිරීමේ උපකරණවල සුලු මට්ටමේ උපාංග නැවත සවිකිරීමට හැකිවිය යුතුය.
   - මෙරට රෙගුලාසි වලට අනුව නිරීක්ෂණය, දෝෂ හඳුනාගැනීම, නිර්මාණ අවශ්‍යතාවයට සරිලන පරිදි දැනට පවතින මෙහෙයුම් ධාරිතාව නිර්ණය කිරීම වැනි HVAC පරීක්ෂණ ක්‍රියාපටිපාටීන් පිළිබඳ දැනුම තිබිය යුතුය.
   - ඉංජිනේරු රූපසටහන්, පිරිවිතර, ක්‍රමාණුරූප, තනි රේඛා රූපසටහන් සහ ද්‍රව්‍ය ලේඛන කියවීමට සහ ඒවා භාවිතයෙන් කාර්යයන් සිදුකිරීමේ හැකියාව තිබිය යුතුය.

5. **නිපුණතා සහ හැකියාවන්** -
   - පද්ධති භාවිතා කරන්නන්ගේ විමසීම් සඳහා පිළිතුරු සැපයීමට මනා සන්නිවේදන සහ අන්තර්පුද්ගල හැකියාවන් තිබිය යුතුය.
   - කණ්ඩායම් සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීමට, වැඩ පීඩනය යටතේ කටයුතු කිරීමට මෙන්ම දැඩි කාලසටහනකට අනුව කටයුතු කිරීමේ හැකියාව තිබිය යුතුය.
   - වැඩමුර සඳහා නම්‍යශීලීවීම සහ දවසේ ඕනෑම වේලාවකදී හදිසි ඇමතුම් සඳහා පිළිතුරු දීමේ හැකියාව තිබිය යුතුය.
   - වසර 5ක සිට පවත්වාගෙන එන වලංගු, ද්විත්ව කාර්යය පංතියේ රිය ධාවන බලපත්‍රයක් තිබිය යුතුය.

**අයදුම් කරන ආකාරය:**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරී ව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**අවශ්‍ය ලේඛන:**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය**. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- වෘත්තීය පාඨමාලා සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)
- අදාළ රියදුරු බලපත්‍රය (පැති දෙකම)

**තැපැල් හෝ ඊමේල් මඟින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2024 **නොවැම්බර්** 22 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.

තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.